www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 7 ශ්‍රේණිය

කාලය : පැය
Time : hours

## SINHALA – I

## සිංහල – I

Name :- ..................................................... Grade : -................ Index number:-....................

01. ආසියානු ජනකතා දෙවන පොතෙන් උපුටාගත් "ගොවි බිරියගේ නුවණ" කවර රටක ජන කතාවක් ද?

(i) ඕස්ට්‍රේලියාව (ii) චීනය
(iii) බුරුමය (iv) පාකිස්ථානය

02. ජන කථාවක් වසර ගණනාවක් තිස්සේ දේශ දේශාන්තරයන්හි ව්‍යාප්ත වීමට සෘජු හේතුවක් නොවන්නේ,

(i) අසන්නා තුළ රසයක් ජනිත වීම.
(ii) පරිවර්තන සාහිත්‍යයට එක්ව තිබීම.
(iii) අන්තර්ගත හරය සනාතන අගයකින් යුතු වීම.
(iv) කුතුහලය ජනනට වන පරිදි හැඩගැසී තිබීම.

03. "කියන්නා කෙසේ කීවත් අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුය" යන්න,

(i) ඉඟිවැකියකි. (ii) ප්‍රස්තාපිරුළකි.
(iii) උපමාවකි. (iv) ආප්තෝපදේශයකි.

04. සමාන පදයක් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(i) අහස = නුබ ගුවන ගගන (ii) මුහුණ = වුවන වත මුව
(iii) කීර්තිය = යසස කිත් කිතු (iv) මුහුද = සිඳු සමුදුර සිසි

05. සිංහල භාෂාවට ම අනන්‍ය ව අක්ෂර විශේෂය වන්නේ,

(i) මහාප්‍රාණ අක්ෂරය. (ii) අනුස්වාරය හා විසර්ගය ය.
(iii) සඤ්ඤක අක්ෂරය. (iv) අල්ප ප්‍රාණ අක්ෂරය.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

06. අක්ෂර වින්‍යාසය සම්බන්ධයෙන් පහත රීති අතරින් නිවැරදි වන්නේ,

(i) "පිළී" හා "පොළ" යන්නෙහි සෑම විටම මූර්ධජ "ළ" කාරය යෙදේ.
(ii) ණය යන අදහස දෙන වචන වලට අමතරව මූර්ධන "ණ" අක්ෂනයෙන් ආරම්භ වන වචන බොහෝ තිබේ.
(iii) ගැටය සහිත ඇලපිල්ලට පසුව යෙදෙන්නේ මූර්ධජ "ණ" අක්ෂරය යි.
(iv) රකාරාංශය සහිත අක්ෂරයකට පසුව යෙදෙන්නේ දන්තජ "න" අක්ෂරය යි.

(i) අ සහ ආ රීතීන් ය. (ii) අ සහ ඇ රීතීන් ය.
(iii) ආ සහ ඇ රීතීන් ය. iv. ඇ සහ ආ රීතීන් ය.

07. කමත් ව්‍යවහාරයේ "ගොයම් ගොඩ" යන්නට භාවිතා කෙරෙන වචනය වන්නේ,

(i) අරක්වල ය. (ii) වට මළුව ය.
(iii) බැත ය. iv. උප්පිඩ ය.

08. ගවයන් කමතට බසින මාර්ගය හඳුන්වන්නේ,

(i) අත්තම ලෙස ය. (ii) මෝල්කඩ ලෙස ය.
(iii) දෙවැට ලෙස ය. (iv) සප්පායම ලෙස ය.

09. ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රදේශයේ ප්‍රධාන භාෂාව වන්නේ,

(i) ආන්ද්‍ර දෙමළ ය. (ii) අන්ධර දෙමළ ය.
(iii) තෙලුගු ය. (iv) හින්දි ය.

10. "කෝමල රේඛා" පද්‍ය සංග්‍රහය රචනා කරන ලද්දේ,

(i) කුමාරතුංග මුණිදාස (ii) මහගමසේකර
(iii) සුනිල් ආරියරත්න (iv) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ

11. "<u>සේපාලිකා මල් ගුලා</u>
රෑට <u>හොරෙක් හොලවලා</u>
නැටි <u>රතු කර</u> හෙවනැලි යට
<u>බිම හැම</u> තැන විසිරුවා" යන පද්‍යයෙහි යටින් ඉරි ඇඳ ඇති පද තුළින් නිමවා ඇති කාව්‍ය උපක්‍රමය නම් කරන්න.


agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

12. යමකට යමක් සමාන කිරීමේදී උපමා වාචී නිපාත භාවිත නොකළ විට එම යෙදුම,

(i) උපමාවකි. (ii) සංකල්ප රූපයකි.
(iii) රූපකයකි. (iv) අනුප්‍රාසය යි.

13. පහත වචන අතරින් උපසර්ගයක් භාවිත නොවන වචනය සොයන්න.

(i) පරසිරිත්. (ii) විරිත්
(iii) සුපිරිසිදු (iv) අවශේෂ

14. "සමනොළ මුහුණ මහ සමුදුර මෙවුල් බර
සුළකළ පුවක ලක'ගන සිරි යොවුන් වර"
මෙම කවියේ සඳහන් ස්ත්‍රී ආභරණය කුමක් ද?

(i) මණිමේඛලාව. (ii) පා සළඹ
(iii) මාලය (iv) වළලු

15. සිරිපා ගමනේදී "සැහැල්ලුව" හා "සංහිඳේ" යනු,

(i) ඇඳුම් හා ජලය යි. (ii) ආහාර හා ජලය යි.
(iii) ගමන් මල්ල හා ඉඩකඩ යි. (iv) දරුවන් හා නිවස යි.

16. විරුද්ධ පද නිවැරදිව යෙදී ඇති වරණය තෝරන්න.

(i) සම්මාන - අපවාද (ii) බාහිර - පිටස්තර
(iii) යහගුණ - දෙගුණ (iv) අන්ත - අනන්ත

17. අනවසාන ක්‍රියා සඳහා උදාහරණ වන්නේ,

(i) පනිමින්, නටා (ii) හඬමින්, කරයි
(iii) සිතයි, සිතුවේය (iv) නැවතී, බලයි

18. මධ්‍යම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද පමණක් ඇතුළත් වරණය වන්නේ,

(i) මම, අපි, නිළිය, නුඹ (ii) නුඹ, තෝ, නුඹලා, තොපි
(ii) තොපි, තෝ, අපි, තාත්තා (iv) අම්මා, නිමල්, තාත්තා, මම

19. මිනිසුන් ජීවත්වන ලෝකය හඳුන්වන තනි පදය වන්නේ,

(i) සුර ලොව ය. (ii) නර ලොව ය.
(iii) බඹ ලොව ය. (iv) නා ලොව ය.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## I කොටස

❖ 1 සහ 2 ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

(1) 1. සඟරාවකට හෝ සාමාන්‍ය පුවත් පතකට ලිපියක් ලිවීමේදී ඔබ විසින් වැඩි අවධානයක් යොමු නොකරන ක්ෂේත්‍රයන් පිළිබඳව බිත්ති පුවත් පතකට ලිපියක් ලිවීමේදී අවධානය යොමු කළ යුතු ය. එවන් ක්ෂේත්‍ර දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(1) 2. පරිසරයට නිතර එකතු වන විද්‍යුත් අපද්‍රව්‍ය දෙවර්ගයක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(1) 3. විද්‍යුත් අපද්‍රව්‍ය පරිසරයට එක්වීම වැළැක්වීම තේමා කර ගනිමින් ඔබ ලියූ ලිපියෙහි යෝජනා කළ විකල්ප දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(1) 4. බිත්ති පුවත් පත් නිර්මාණයේ දී ඔබ සතුටට පත්වූ අවස්ථා දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(1) 5. විද්‍යුත් අපද්‍රව්‍ය පිළිබඳ පාඩම ඉගෙන ගැනීමෙන් අනතුරුව ඔබ ජීවිතයට එක්කර ගැනීමට තීරණය කළ පුරුදු දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(1) 6. පහත වචන පැහැදිලි කරන්න.

(i) හරිතාගාර වායු

(ii) ප්‍රතිචක්‍රීකරණය

(iii) ප්‍රතිශක්තීකරණය *(ලකුණු 6 යි)*

(2) දී ඇති මාතෘකා අතරින් එකක් තෝරාගෙන,

(i) රචනය සඳහා සැකිල්ල නිර්මාණය කරන්න. *(ලකුණු 04 යි)*

(ii) සැකිල්ල අනුව ඡේද වෙන් කරමින් රචනය ලියන්න. *(ලකුණු 10 යි)*

➢ මිහි මව සුරකිමු

➢ නුවණින් සියළු දුක් නැසෙයි

➢ සඳ පහන් රැයක්

➢ පොදු දේපල සුරකිමු *(ලකුණු 14 යි)*

(3) (i) නිවේදනයක් සැලසුම් කිරීමේදී සැලකිය යුතු කරුණු තුනක් ලියන්න. *(ලකුණු 03 යි)*

(ii) නිවේදනයක් ඉදිරිපත් කිරීමේදී සැලකිය යුතු කරුණු දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(iii) පහත මාතෘකා අතරින් එකක් තෝරාගෙන පාසලේ විවේක කාලයේදී ඉදිරිපත් කිරීමට සුදුසු (විනාඩි තුනකින් පමණ) නිවේදනයක් සකස් කරන්න.

වාර්ෂික ක්‍රිකට් තරගාවලිය

කලා උළෙල

කුමාරතුංග මුණිදාස සමරු දිනය *(ලකුණු 10 යි)*

(4) (i) සිනා කුමරිය කවි පන්තිය රචනා කළ කතුවරයා නම් කරන්න. *(ලකුණු 01 යි)*

(ii) සිනා කුමරිය කවි පන්තිය තුළින් කතුවරයා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කළ අදහස් දෙකක් ලියන්න. *(ලකුණු 02 යි)*

(iii) "මොකටද අම්මේ අම්මට ගැහුවේ මාමලා දෙන්නෙක් වට <u>කරලා</u>
ඇඟ පත තැලිලා රිදෙනව ඇතිනේ කොච්චර ගැහුවද බැඳ <u>දමලා</u>"

"දෙපා සතාගේ ළඟ කා බීගෙන හිටියම ගති ගුණ වෙනස් <u>වෙලා</u>
මාමල ඔහොමයි උන්ගේ බහට ම නැමෙනව නෑ කම අත <u>ඇරලා</u>"

www.agaram.lk
සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(i) ඉහත සංවාදය සිදු කරන දෙදෙනා අතර ඇති නෑ සබඳතාව කුමක් ද?

(ii) "මිනිසා" යන්නට මෙහි යොදා ඇති යෙදුම කුමක් ද?

(iii) කවියේ ඉරි ඇඳි පද මගින් නිර්මාණය කරගෙන ඇති කාව්‍ය අලංකාරය කුමක් ද?

(iv) කවියෙන් පාඨකයා තුළ මතු කරන හැඟීම් දෙකක් ලියන්න. *(ලකුණු 10 යි)*

(5) පහත උපසර්ග භාවිත කර වචන සාදන්න.

පර -

අව -

නි -

දු -

වි - *(ලකුණු 10 යි)*

(6) (i) පහත වාක්‍යයේ වැරදි සහිත පද බෙදීම් නිවැරදි කර නැවත ලියන්න.

අපි ජීවිතයේ විවිධ අරමුණු සඳහා විවිධ අවස්ථාවලදී ලේඛන කාර්යයන් හි නිරත වෙමු.

*(ලකුණු 05 යි)*

(ii) උක්තයට අනුව ආඛ්‍යාතය නිවැරදි කරන්න.

1. පාසල් දරුවෝ නිදහස් අදහස් කවියට නගයි.
2. රළ පෙළ සුළඟින් නුඹ නැගෙති.
3. තාරකාවෝ අහසේ දිලෙයි.
4. මහ වැසි එදිනෙදා ජන දිවිය කළඹති.
5. තුරු ලතාවෝ වැස්සෙන් නව පනක් ලබයි. *(ලකුණු 05 යි)*

(7) සුදුසු තනි පද යොදා වාක්‍යය නැවත ලියන්න.

(i) <u>බොහෝ දුර දකින්නෝ</u> නායකත්වයට සුදුසු ය.

(ii) පෙර රජවරු <u>පර්වත ආදියෙන් වට වූ ස්ථාන</u> රාජධානි සඳහා තෝරා ගත්හ.

(iii) <u>පුරාණ කාලයට අයත් නටඹුන්</u> රටක ඉතිහාසයට සදෘශ්‍ය සාදක සපයයි.

(iv) <u>නොයෙක් දේශයන්හි සංචාරය කිරීමෙන්</u> මනස පටු අදහසින් මිදෙයි.

(v) <u>සිය දේශයට විරුද්ධ අදහසින් කටයුතු කිරීම</u> පසුකාලීන සිත් වේදනාවන්ට හේතුවේ.

*(ලකුණු 10 යි)*

(8) ඔබ, පාසලේ පරිසර නියමු හට කණ්ඩායමේ නායකත්වය දරන්නේයයි සිතා පාසලේ සණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා උපදෙස් හා භෞතික සම්පත් ලබා දෙන මෙන් ඉල්ලමින් විදුහල්පති තුමා මගින් කොළඹ මහ නගර සභාවේ සභාපති තුමා වෙත යවන රාජකාරී ලිපිය ලියන්න. *(ලකුණු 10 යි)*

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

agaram.lk